## ඌවපරණගම ප්‍රාදේශීය සභාව
## 2022.07.14 වන දින පැවති මහ සභා වාර්තාව

### 01.පිළිගැනීම

මෙදින පෙ.ව.09.30 ට ආගම සිහි කිරිමෙන් පසු, පැමිණ සිටි මන්ත්‍රී මණ්ඩලය ඇතුළු සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

### 02.පැමිණීම .

| | |
|---|---|
| 1. කේ.ඒ.සමින්ද සුදර්ශන මැතිතුමා | ගරු සභාපති |
| 2 ආර්.ඩී.ගුණපාල මැතිතුමා | ගරු උපසභාපති |
| 3. ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 4. ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. එම්. කාංචනා රුවන්මාලි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 6. ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7.ජේ.එම්.බන්දුල ධර්මසිරි මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. ඩී.එම්.තිලකරත්න බණ්ඩා මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9.ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. නාරායනන් වරදරාජ් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11 ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ආර්.එම් නාලිනි රාජපක්ෂ මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 13. ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. ඩබ්.පී.සමන්ත වර්ණසූරිය මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එස්.එම්.සුජිත් ප්‍රසන්න මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. කේ.එම්.කරුණාතිලක මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඩී.එම්. කරුණාදාස මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. ඒ.එම්.චමින්ද ලසන්ත අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20.ඒ.එම්.මංජු ප්‍රියනාත් අබේකෝන් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. ඒ.පී.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22. ඩබ්.එම්.උපාලි විරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 23.එම්.එම් සුනේත්‍රා නන්දනී මන්තිලක මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 24. කන්දසාමි පේරාම්බිගයි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 25. එම්.එම්.නිර්මලා පුෂ්ප කුමාරි මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 26. ටී.බී. සුභසේන වීරසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. එල්.එච්.ධර්මසේන මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 28. ඩබ්ලිව්.ජී.විජේසිංහ මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. එස්.අඩෛකලම් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 30. ජී.දුලානි ධර්මා ගොඩකුඹුර මැතිතුමිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි |
| 31 පුණ්‍යදාස සුගුණකුමාර් මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 32.ඩබ්.එම්. ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 33. ඩබ්.එම් ජයසේකර මැතිතුමා. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

34. ටී.ඩබ්.ජී. උපසේන වැවේවත්ත මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම. –**

2022.06.09 දිනැති මහා සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පි.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන :-**

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.ජී.ඒ.සරත්චන්ද්‍ර මැතිතුමා අසනිප තත්ත්වයෙන් පසු වන බැවින්, අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩී.එම්.කමල් දේශප්‍රිය දිසානායක මැතිතුමා අසනිප තත්ත්වයෙන් පසු වන බැවින්, අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි,ජේ.එම්.තනුජා රසාංගිකා මැතිතුමිය අසනිප තත්ත්වයෙන් පසු වන බැවින්, අද දින සභා වාරය සඳහා නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ අනුව අදාල නිවාඩුව අනුමත කරන ලදී.

- ❖ වතුකම්කරු වැටුප් ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් සොයා බලා පවතින නීත්‍යානුකූල තත්ත්වය අනුව කටයුතු කරන ලෙස අදාළ පාර්ශවයන් දැනුවත් කල බව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දන්වා එවා ඇති බව මෙයින් නිවේදනය කරනවා.

- ❖ වතුකම්කරු වැටුප් ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා පවතින නෛතික විධි විධාන යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් දන්වා එවා ඇති බව නිවේදනය කරනවා.

- ❖ 2021.03.05 දිනැති අංක 2217/37 දරණ අති විශේෂ ගැසට් පත්‍ර යේ සඳහන් නිවේදනය පරිදි තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තයේ අවම දෛනික වැටුප වශයෙන් රු.900.00ක් සහ අයවැය සහන දීමනාව ලෙස රු.100.00වශයෙන් රු.1000.00ක් ගෙවිය යුතුය.දිනකට නියමිත කාල සීමාව තුළ සේවය කරන සේවකයකු සඳහා මෙම වැටුප ගෙවීමට සේවා යෝජකයන් නීතියෙන් බැඳී ඇති බවත්,මේ ආකාරයට ගෙවීම් නොකරන වතු සමාගම් ඔබ ප්‍රදේශයේ පවතී නම්, ඒ පිළිබඳ නිශ්චිත තොරතුරු බදුල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත ලබා දෙන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව ලිපියක් මඟින් දන්වා එවා ඇති බව නිවේදනය කරනවා.

පෙ.ව. 9.45ට ගරු ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා, කේ.එම්.කරුණාතිලක මැතිතුමා, ඒ.එම්.මංජු ප්‍රියනාත් මැතිතුමා, ඩී.එම්.ලලිත් වසන්ත දිසානායක මැතිතුමා සහ එම්.එම්.අසංක කමල් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන ලිපි;-**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ජී.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා -** අඹගහවත්ත, රත්නෝදාගම, මුත්තයියා ස්ටෝර්ස් හි පදිංචි එම් සරවණමුත්තු මහතා විසින් ඉළුක්වෙල ග්‍රාම සේවා වසමේ රත්නෝදාගම කොටසට අයත් සොහොන් භූමියේ ඔහුගේ පෞද්ගලික වියදමින් සොහොන් ගෙයක් සෑදීමට අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලද අතර, සොහොන් ගෙයක් සඳහා අවසර ලබාදිය හැකි බැවින් අවසර ලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී.

**04.යථාපරිදි කල් දී ඇති ප්‍රශ්ණ :- නැත**

**05.යථාපරිදි කල් දීඇති යෝජනා :-**

**<u>යෝජනා අංක 01 – පාලි පාඨමාලාවක් පැවැත්වීම සඳහා</u>**

ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දහම් පාසල්වල ගුරුවරුන් වෙනුවෙන් පාලි විෂය ඉගැන්වීම සඳහා අප ආයතනයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරි,එස්.පී.අමිල උදයන්ත සෙනෙවිරත්න මහතාගේ සේවය ලබා ගෙන පාලි පාඨමාලාවක් පැවැත්වීමටත්, ඒ සඳහා වැයවන රු.71000.00ක මුදල සභා අරමුදලින් දැරීමත් සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.එම්.උපාලි වීරසිංහ මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 01 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 02 – ප්‍රින්ටරයක් මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම</u>**

2022.06.09 දින පැවති මහ සභාවට කැඳවා ඇති මිළ ගණන් අනුව කාර්යාලය සඳහා ප්‍රින්ටරයක් මිළදී ගැනීම වෙනුවෙන් බණ්ඩාරවෙල, සොලිඩ් ටෙක්නොලජි ආයතනය වෙත ගෙවිය යුතු රු.129,700.00ක බිල්පත පියවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ආර්.එම්.නාලිනි රාජපක්ෂ මැතිතුමිය :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 02 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 10.00ට ගරු ඩී.එම්.තිලකරත්න බණ්ඩා මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**<u>යෝජනා අංක 03 – කොම්පෝස්ට් අංගනය සඳහා කසල ඇඹරුම් යන්ත්‍රයක් මිළදී ගැනීම</u>**

ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ අපද්‍රව්‍ය කැබලි කිරිම සඳහා යොදා ගන්නා යන්ත්‍රය අක්‍රීය තත්ත්වයේ පවතින බැවින්, 2022.06.09 දින පැවති මහ සභාවට කැඳවා ඇති මිළ ගණන් අනුව හා 2022.06.09 දින පැවති තාක්ෂණ කමිටු නිර්දේශය මත කසල ඇඹරීම සඳහා රු.669,680.00ක් වටිනා කසල ඇඹරුම් යන්ත්‍රයක්(MC15E MULITICHOPPER CONPLE 15HP) මිළදී ගෙන සහා අරමුදලින් බිල්පත පියවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,එම්.එම්.අසංක කමල් බණ්ඩාර මැතිතුමා :-**

ගරු සභාපති තුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 03 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

තියෙන මැෂින් එකේ වර්තමාන තත්ත්වය කොහොමද?

**ගරු සභාපතිතුමා :-**

මේ සම්බන්ධයෙන් විස්තර දැන ගැනීම සඳහා සභාව කාරක සභාවක් බවට පත් කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි,සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ගරු සභාපතිතුමනී, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

කාරක සභා අවස්ථාවේ සංවර්ධන නිලධාරි,උදය ප්‍රදීප් මහතා සඳහන් කළේ ඩීසල් වලින් වැඩකරන පැරණි යන්ත්‍රයක් දැනට තිබෙන බවත්, කැබලි කිරීමේ යන්ත්‍රයේ බක්කිය දිරා ඇති ගැටළුව නිසා දැනට මාස අටක් විතර කොම්පෝස්ට් කැබලි නොකල බවත්, දැනට එම යන්ත්‍රය හදන්න දාලා වැඩ කෙරීගෙන යන බවත් හා එම හේතූන් මත නව යන්ත්‍රයක් ඇනවුම් කිරිමට කටයුතු කල බවත්ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ඩීසල්වලින් හා විදුලියෙන් මෙපමණ ප්‍රමාණයක් කොම්පෝස්ට් නිපදවිය හැකියැයි ගණනය කර තියෙනවාද?

**සංවර්ධන නිලධාරි, උදය ප්‍රදීප් මහතා:-**

තියෙන මැෂින් එක ඩීසල්වලින් ක්‍රියාත්මක වන නිසා ඩීසල් ප්‍රශ්නයත් එක්ක කරගෙන යන්න අමාරුයි. විදුලියෙන් වැඩ කරන මැෂින් එකෙන් විනාඩි පහට 200Kg ප්‍රමාණයක් අඹරන්න පුළුවන් කීවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා :-**

පොහොර අලෙවියක් තියෙනවාද?

**සංවර්ධන නිලධාරි, උදය ප්‍රදීප් මහතා:-**

දැනට මැෂින් එක අක්‍රීය තත්ත්වයේ පැවතීම නිසා කැට පිටින් දැම්මම 10%ක ප්‍රමාණයක් තමයි හැලිලා එන්නේ. ඒ නිසා කොම්පෝස්ට් වැඩි අලෙවියක් සිදු වන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, සභාව නැවත මහා සභා අවස්ථාවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ආර්.ඩබ්.ඩබ්.එම්.මානෙල් කුමාර රාජපක්ෂ මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.
**ගරු සභාපති තුමා :-**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවූ බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 04 – 2022 වර්ෂයේ සභා කර්මාන්ත යෝජනා අනුමත කිරිම</u>**

2022.05.25 දින මුදල් හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශය පරිදි 2022 වර්ෂය සඳහා සභා අරමුදල් මඟින් පහත සඳහන් කර්මාන්ත සිදු කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අ.අ | සංවර්ධන යෝජනාව | මුදල රු. |
|---|---|---|
| 1 | වැලිඋල්ල උස්හින්න මාර්ගය සංවර්ධනය කිරිම | 60,000.00 |
| 2 | වැලිඅරාව ගම සිට නෙල්ලිගස්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරිම | 100,000.00 |
| 3 | කෝට්ටගොඩ-නිකගොල්ල දක්වා මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම | 80,000.00 |
| 4 | තෙල්හවඩිගම සිට කුඩාව මාර්ගය සකස් කිරීම | 60,000.00 |
| 5 | තෙල්හවඩිගම කුකුලැල්බොක්ක මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම | 50,000.00 |
| 6 | ගලහගම හුණුගල ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරිම | 40,000.00 |
| 7 | ගලහගම වැලිබිස්ස ගල්ගේවෙල මාර්ගය සකස් කිරීම | 50,000.00 |
| 8 | නෙල්ලිගස්තැන්න මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරිම | 100,000.00 |
| 9 | ඉදිගහදෝව සිට ඉඹුල්ගස්හින්න මාර්ගය නිමල් ජයසිංහ මහතාගේ නිවස අසල කොටස ජේසිබි යන්ත්‍රය යොදා සංවර්ධනය කිරිම | 15,000.00 |
| 10 | එම්.එම්.ගැමුණු චමින්ද මාරසිංහ මහතාට විදුලිය ලබාදීම | 28000.00 |
| 11 | පහල කොටවෙර ප්‍රධාන මාර්ගයේ සිට වෙල්යාය දක්වා මාර්ගය සකස් කිරිම | 100,000.00 |
| 12 | පනාගොඩ කෘෂි පාර කොන්ක්‍රීට් කිරීම | 100,000.00 |
| 13 | ගල්තුඹ පඹේදෝව එක්සත් සහනාධාර සමිතියේ සමිති ශාලා ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබාදීම | 30,000.00 |
| 14 | අළුතැන්න සිට කොටබෝගහඇල්ල මාර්ගය සංවර්ධනය කිරීම | 200,000.00 |

| | | |
|---|---|---|
| 15 | කටුග්ලල විහාරස්ථානයට පිවිසෙන මාර්ගය සකස් කිරීම | 100,000.00 |
| 16 | තුප්පිටිය විද්‍යාලයේ ක්‍රීඩාපිටිය බැකෝ යන්ත්‍රය යොදා පස්කපා සකස් කිරීම | 75,000.00 |
| 17 | මහකුඹුර ප්‍රධාන මාර්ගයේ සිට තලංගමුව ප්‍රජාශාලාව හරහා වෙල්යාය දක්වා මාර්ගය පස් කැපීම | 75,000.00 |
| 18 | ගලපිට දේවාල මාර්ගය කොන්ක්‍රීට් පඩි යොදා සැකසීම | 20,000.00 |
| 19 | පොදිමිල්ල සිට පණුවැල්ල දක්වා අඩිපාර පුළුල් කිරීම | 100,000.00 |
| 20 | උඩපේරුව හංදියේ සිට ඉඹුල්ගස්හින්න සෞඛ්‍ය කාර්යාලය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 100,000.00 |
| 21 | සපුගහඋල්පත සිට තලාව දක්වා බෝමළුව දක්වා මාර්ගයේ සංවර්ධනය නොකල කොටස සංවර්ධනය කිරීම | 150,000.00 |
| 22 | ගලහගම කපුකොටුව මාර්ගය සකස් කිරීම | 60,000.00 |
| 23 | ගල්තුඹ බෝගහවත්ත පානීය පොදු ළිඳ පිළිසකර කිරීම | 100,000.00 |
| 24 | හාගිලිඇල්ල නව පාලම අසල සිට ගම මැද දක්වා මාර්ගය පස් කපා සංවර්ධනය කිරිම | 100,000.00 |
| 25 | අම්පිටිදෝව ගල්ගේහින්න මාර්ගය බෝක්කු දමා සංවර්ධනය කිරිම | 50,000.00 |
| 26 | ජයසූරිය මාවත සිට ඌමාඔය ගඟට දිය නෑමට භාවිතා කරනු ලබන මාර්ගය සංවර්ධනය කිරිම හා දිය නාන ස්ථානය සංවර්ධනය කිරිම | 100,000.00 |
| 27 | අඹගස්දෝව ආයුර්වේදය සඳහා බෙහෙත් දැමීම සඳහා කාමරයක් වෙන් කිරිම | 50,000.00 |
| 28 | පේරවැල්ල දඹේවෙල ගෙදර මාර්ගය සංවර්ධන කිරිම | 100,000.00 |
| 29 | උඩුහාවර ගල්පීල්ල සංවර්ධනය කිරිම | 125,000.00 |
| 30 | කොරදේකුඹුර සිට උඩුහාවර පන්සල දක්වා පඩිපෙල සංවර්ධනය කිරිම | 75,000.00 |
| 31 | රතඹ රත්තල්අරාව ඇල මාර්ගයේ බෝක්කුව ඉදිකිරිම | 100,000.00 |
| 32 | දරගල දොඩම්ගොල්ල පඩිපෙල මාර්ගය සංවර්ධනය කිරීම | 75,000.00 |
| 33 | කටුගල්ල උඩුහුල්පත මාර්ගයේ බෝක්කුව ඉදිකිරිම | 75,000.00 |
| 34 | ශ්‍රී සුමනජෝති අවමංගල්‍යාධාර සමිතියේ රැස්වීම් ශාලාවට යන මාර්ගය සංවර්ධනය කිරිම | 100,000.00 |
| 35 | නාරාව කපුහේන මාර්ගයේ පැති කාණුවට බෝක්කු බට ලබාදීම | 50,000.00 |
| 36 | පන්නලවෙල වත්තේගෙදර පොදු ළිඳ සංවර්ධනය කිරිම | 50,000.00 |
| 37 | මැටිවලලන්ද,දවවේගම,දවටැල්ල මාර්ගය ජේසිබි යන්ත්‍රය දමා සංවර්ධනය කිරිම | 100,000.00 |
| 38 | මූදනාව ජල පිහිල්ල සංවර්ධනය කිරිම | 50,000.00 |
| 39 | ඇත්කඳවක හා සපුගොල්ල වසම් යා කරන වහුගාලතැන්න මාර්ගයේ ඉතිරි කොටස ජේසිබි යන්ත්‍රය මගින් පස් කපා සංවර්ධනය කිරිම | 25,0000.00 |
| 40 | සපුගොල්ල,මඩමවත්ත,කොස්පැලේ හංදිය දක්වා මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරිම | 200,000.00 |
| 41 | ලද්දූම හංදියේ සිට තවලම්පොල පන්සල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම | 200,000.00 |

| | | |
|---|---|---|
| 42 | පරණගම, ගල්පොතුකැටිය මාර්ගයේ ආරම්භක ස්ථානය කොන්ක්‍රීට් කිරිම | 50,000.00 |
| 43 | අලගොල්ලවත්ත අංක 04 සිට අංක 10 දක්වා ලයින් පඩිපෙල සංවර්ධනය කිරිම | 100,000.00 |
| 44 | කිරවල ගම්සභා මාර්ගය සංවර්ධනය කිරිම | 100,000.00 |
| 45 | බලගල සොහොන්ගොඩ මාර්ගය බෝක්කු යොදා සංවර්ධනය කිරිම | 100,000.00 |
| 46 | පල්ලේවෙල කඳුර සංවර්ධනය කර පැති බැම්ම සකස් කිරිම | 50,000.00 |
| 47 | බලගල 4 කණුව සිට ගොඩළිඳ දක්වා මාර්ගයේ අතර ඇති කිරි මණ්ඩලය අසල සිට පහලට ඇති මාර්ගය පස් කපා සංවර්ධනය කිරිම | 150,000.00 |
| 48 | කුමාරපට්ටිය බලගල යායේ ඇති නාන ළිඳ සංවර්ධනය කිරිම | 50,000.00 |
| 49 | කුරුදුගොල්ල සමිති ශාලවට ජලය ලබාදීම | 50,000.00 |
| 50 | කිදිගොඩ ශ්‍රී බෝධිවනරාම විහාරස්ථාන ආවාස සකස් කිරිම සඳහා භූමිය සකස් කිරිමට ජේසිබි යන්ත්‍රය ලබාදීම | 50,000.00 |
| 51 | මස්පන්න ප්‍රධාන මාර්ගයේ සිට ගල්බොක්ක යාය හරහා ඇල්ලන්ද ගම මැද මාර්ගය පස් කපා සංවර්ධනය කිරිම | 100,000.00 |
| 52 | තුප්පිටිය විද්‍යාලය ඉදිරිපිට කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම | 100,000.00 |
| 53 | යාලගමුව බෝගහවත්ත නාන තොටුපල සංවර්ධනය කිරිම | 100,000.00 |
| 54 | තවලම්පොල පාසල් මාර්ගය සංවර්ධනය කිරිම | 150,000.00 |
| 55 | කන්දේඇල ශ්‍රී රතනජෝති බෞද්ධ මධ්‍යස්ථානයේ චෛත්‍යය ඉදිකිරිමට බිම සැකසීමට ජේසිබි යන්ත්‍රය ලබාදීම | 50,000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.ලලිත් වසන්ත දිසානායත මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව. 10.15ට ගරු උප සභාපති,ආර්.ඩී.ගුණපාල මැතිතුමා සභාවට පැමිණෙන ලදි

**<u>යෝජනා අංක 05 – සුසාන භූමි පිහිටි ඉඩම් ඌවපරණගම ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඌවපරණගම ප්‍රාදේශීය ලේකම්ගේ අංක DS-UP/LND.1/PVTLT/1 හා 2022.06.16 දිනැති ලිපිය හා බැදේ.ඒ අනුව පහත නම් සඳහන් සුසාන භූමි ඌවපරණගම ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට, අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාව වෙත යෝජනා කරමි.

| අ.අ | සුසාන භූමියේ නම | වසම |
|---|---|---|
| 01 | වරල්හින්නේ සුසාන භූමිය | පල්ලෙවෙල |
| 02 | මුදුන්පිට සුසාන භූමිය | පල්ලෙවෙල |
| 03 | වරල්හින්නේ පතන සුසාන භූමිය | පල්ලෙවෙල |
| 04 | රජවල්ලිගොඩ සුසාන භූමිය | පල්ලෙවෙල |
| 05 | අම්පිටිගොඩ පතන සුසාන භූමිය | පල්ලෙවෙල |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඒ.පී.අසේල ඉන්ද්‍රානන්ද මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 05 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති තුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**යෝජනා අංක 06 – ඇස්තමේන්තු අනුමත කිරිම**</u>

2022.06.23 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශය පරිදි පහත සඳහන් ඇස්තමේන්තු අනුමත කර, එකී කාර්යය සිදු කර ගැනීමටත්,කාර්යය අවසන් කිරිමෙන් පසු සභා අරමුදලින් ගෙවීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ | කර්මාන්තය | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|---|
| 1 | කොම්පෝස්ට් අංගනයේ පිවිසුම් මාර්ගය වැඩි දියුණු කිරිම | 876,279.82 |
| 2 | ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය සහ කාණු පද්ධතිය වැඩි දියුණු කිරිම | 1,445,596.98 |
| 3 | බෝඹුරුඇල්ල රථගාල හා පැතිබැම්ම සකස් කිරිම | 3,712,364.26 |
| 4 | බෝඹුරුඇල්ල පොදු වැසිකිලිය ඉදිකිරිම | 3,267,246.44 |
| 5 | ආදාහනාගාරය අලංකරණ කටයුතු කිරිම(2022.02.25 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී ගනු ලැබු තීරණය අනුව හා 2022.06.23 දින පැවති මුදල් හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශය පරිදි) | 277,500.00 |
| 6 | මොරගොල්ල බ්‍රොෆින්වත්ත ඉඩම් කොටසේ වැට ගැසීම | 1,000,000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.ඒ.ශ්‍රීනාත් රාජිත තිලකරත්න මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඔබ විසින් ගෙන එන ලද අංක 06 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා :-**

මේ යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතා ඇත්නම් මෙම අවස්ථාවේ ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

කාර්යාල ගොඩනැගිල්ල හදන්න අපි යෝජනා කලා. එහි වර්තමාන තත්ත්වය කොහොමද?

**ගරු සභාපතිතුමා :-**

මේ සම්බන්ධයෙන් විස්තර දැන ගැනීම සඳහා සභාව කාරක සභාවක් බවට පත් කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.එම්.මෛත්‍රීපාල තෙන්නකෝන් මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි,සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

කාරක සභා අවස්ථාවේ කාර්මික නිලධාරි මහත්මිය සඳහන් කළේ සැලැස්මක් සකස් කල බව හා ඉන්පසු දෙසැම්බර් මාසය වන විට මිළ ගණන් වෙනස්වීම මත නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරිමට නොහැකි වු බව හා එම කාර්යය සිදු කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කාරයෙක් ඉදිරිපත් නොවීම වැනි හේතූන් මත එම කාර්යය පසුව ඉටු කිරිමේ මතයකට පැමිණි බවයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.ඒ.වසන්ත සුසිල් කුමාර මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, සභාව නැවත මහා සභා අවස්ථාවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩී.එම්.තිලකරත්න බණ්ඩා මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපතිතුමා:-**

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව වෙනත් කිසිදු විරෝධතාවයක්, අදහසක් ඉදිරිපත් නොවු බැවින් ඉහතකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක සභා වාර්තා සලකා බැලීම -**

- **මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව සලකා බැලීම:-**

2022 ජුනි 23 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රසම්පාදන කමිටු වාර්තා සලකා බලා එකි නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**07.ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන සලකා බැලීම :-**

2022.06.01 දින සිට 2022.06.30 දින දක්වා වන මාසික ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශනය සලකා බලා අනුමත කරන ලදි.

**මිළ ගණන් විවෘත කිරිම**

## I. නිල ඇඳුම් සැපයීම සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | |
|---|---|---|---|
| | | තියාන්ස් ටේලර්ස්, උඩුපුස්සැල්ලාව පාර,වැලිමඩ | සචින් ටේලර්ස්, ලුණුවත්ත. |
| 1 | කාකි රෙදි මීටර් 01ක් | 750.00 | 800.00 |
| 2 | නිල ඇඳුම් කට්ටල 01ක් මැසීමේ කුලිය | 4500.00 | 6250.00 |
| 3 | රාජ්‍ය ලාංඡනය සහිත ලොකු බොත්තම් 01ක් | 150.00 | 180.00 |
| 4 | රාජ්‍ය ලාංඡනය සහිත පොඩි බොත්තම් 01ක් | 120.00 | 140.00 |
| 5 | අත්ලට් 01ක් | 1000.00 | 1250.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් යටතේ තියාන්ස් ටේලර්ස් වෙතින් සේවාව සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

## II. ඇල්කතීන් බට සඳහා මිළ ගණන්

| අ.අ | විස්තරය | මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|---|
| | | පත්මසිරි ස්ටෝර්ස්, ලුණුවත්ත | නිව් සෙවන හාඩ්වෙයාර්, ලුණුවත්ත | බීමා හාඩ්වෙයාර්,වැලිමඩ |
| 1 | අගල් 02 ඇල්කතීන් බට අඩි 200 රෝල් 01ක් | 17,000.00 | 18,000.00 | 17,500.00 |

ඉහත සඳහන් මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පත්මසිරි ස්ටෝර්ස් වෙතින් ද්‍රව්‍ය සපයා ගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදි.

**08.වෙනත් කරුණු :-**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.පි.සමන්ත වර්ණසූරිය මැතිතුමා :-**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මේ දවස්වල ටෙලි නාට්‍යයක් රූගතකරණය ලැස්ති කරගෙන ඉන්නවා. බෝඹුරුඇල්ල දියඇල්ල ආශ්‍රිතව තේමා ගීතය නිර්මාණය වෙලා තියෙන බැවින්, මේ සෙනසුරාදා/ඉරිදා රූගත කිරීම් කරන්න යොදාගෙන තියෙනවා. මම ඉල්ලීමක් කරනවා අපේ ප්‍රදේශයේම දුවා දරුවන් ටිකක් තමයි මේ ටෙලිනාට්‍යය සඳහා සහභාගි වෙන්නේ. හතලිහක විතර පිරිසක් යනවා ඒ සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තුවෙන් නිදහස් කර දෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ටී.බී.සුභසේන වීරසිංහ මැතිතුමා :-**

මම පහුගිය සභා වාර කිහිපයකදීම කතා කලා උළුගල පවත්වාගෙන යන කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන්. එයින් හමන දැඩි දුගඳ නිසා උළුගල රාජමහා විහාරය,බෝවෙල තැපැල් කාර්යාලය,දේවාලය,ග්‍රාම සේවා කාර්යාල වගේ ප්‍රජා සහභාගීත්වය තියෙන ස්ථාන දැඩි පීඩාවකට ලක්වෙලා තියෙන්නේ. මැස්සෝ බෝවෙලා හැම ගෙදරකම. ඔබතුමා කණ්ඩායමක් එවලා තිබුණා.මේ දක්වා ඒ කටයුත්ත පාලනය කිරීම සම්බන්ධයෙන් ගත්ත කිසිඳු පියවරක් නැහැ.එම පුද්ගලයා මෙම ව්‍යාපෘතිය කරගෙන යාම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නැහැ. හැබැයි මිනිසුන්ට පීඩා නොවන විදිහට. වැස්ස ආවාම සෝදාගෙන යන්නේ කුඹුරුයාය පැත්තට හා උඩපේරුව පහල ඔය පැත්තට.මිනිස්සුන්ට ඒක බලපෑමක්.ඒ සම්බන්ධයෙන් නැවත අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

අනෙක් කාරණය ගොවි නිෂ්පාදන ගම්වල තියෙනවා. ඒ එළවළු මේ වෙනකොට වෙළඳපලට යවාගන්න බැරි තත්ත්වයක් තියෙන්නේ ඉන්ධන ප්‍රශ්නය නිසා. ඒ නිසා පුළුවන් නම් ගම්වලින් වාහන කිහිපයක් හෝ තෝරාගෙන අත්‍යවශ්‍ය සේවාවන් යටතේ තෙල් ටිකක් ලබා දෙන්න.ගොවියෝ මේ වෙලාවේ අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ.

අපේ රට මේ වෙනකොට ඉතාමත් දුර්භාග්‍ය සම්පන්න කාලයකට මුහුණ දෙමින් සිටිනවා. අපි මහජන නියෝජිතයින් විදිහට ප්‍රාර්ථනා කරමු මේ දුර්භාග්‍ය සම්පන්න කාලය අවසන්වෙලා අපේ රටේ කවුරු හෝ නායකත්වය භාර අරගෙන ඉදිරියේ රටේ හොඳ තත්ත්වයක් ඇති කරන්නට ඒ පාලන තන්ත්‍රය යහපත් අතට හැරිලා මේ තියෙන අරාජිකත්වය මග හැරිලා හැම දෙනාගේම ජීවිත සුඛිත මුදිත වෙන්න කියලා. අද මිනිසුන්ට ජීවත්වෙන්න අමාරු තත්ත්වයක් උදාවෙලා තියෙන්නේ.නීත්‍යානුකූල ක්‍රමයක් පවතීනම් පහුගිය කොරෝනා කාලයේ දී වගේ අපේ මේ කර්මාන්තවලට වියදම් කරන මුදල් හෝ යොදවලා අපේ මිනිසුන්ට යම්කිසි සහනයක් ලබා දෙන්න පුළුවන්නම් ලබා දෙමුයි කියන ඉල්ලීම කරමින් අපේ රටට නැවත හොඳ කාලයක් උදාවේවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

සියලු දෙනාගෙන්ම අවසරයි.ඌවපරණගම ආසනයේ මහජනතාවගේ ඡන්දය අරගෙන අපි මෙතනට මහජන නියෝජිතයෝ හැටියට ඇවිත් ඉන්නේ. අපිට යමක් කරන්න බැරි එක ඇත්ත. පළාත් සභා නැහැ දැන්. පාර්ලිමේන්තුවේ අයට කරන්න තිබුණ ඉඩකඩ දැන් ඉවරයි.අද පාරට බැහැපුවම යන්න එන්න වාහනයක් නැහැ.කන්න බොන්න දේවල් නැහැ.අහිංසක පවුල්වල මිනිස්සු අසරණ වෙලා ඉන්නේ. මුළු රටේම ජනතාව වෙනුවෙන් ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන අතර මේ රට වැටිලා තියෙන තත්ත්වයෙන් මිදිලා රට ස්වයංපෝෂිත කරන්න අවස්ථාව උදාවේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ,ඩබ්.එම්.ප්‍රියන්ත බණ්ඩාර විජේතුංග මැතිතුමා :-**

සියලු දෙනාගෙන්ම අවසරයි.පහුගිය සභා වාරයේදී මගේ යෝජනාවක් ඉදිරිපත් කලා කරගහඋල්පත වසමේ ගවයින් නිදැල්ලේ ඇමීම තහනම් බව ප්‍රකාශ කරමින් එනවුස් එකක් ගියා. එයට සභාපතිතුමා,ලේකම්තුමිය ඇතුළු ඒ සඳහා දායකත්වය දැක්වූ සියලු දෙනාට

ස්තුතිවන්ත වෙනවා.ඒ අවස්ථාවේදී අපේ උපසභාපතිතුමා ප්‍රකාශ කලා පේරවැල්ල මංසන්ධිය දක්වා දැනුවත් කිරිම කරන්න කියලා. ගරු සභාපතිතුමනී, එදා අතරමගදි වාහනය ආපදාවකට ලක්වුණා. මම කීවා වාහනය ගරාජයකට දාලා ඉක්මනින් හදා ගන්න කියලා.ඒ නිසා එතුමාගේ ඉල්ලීම ඉටු කරන්න බැරිවුණා. අනෙක් කාරණය සභාපතිතුමනී, අපි යෝජනාවක් ගෙනාවම එය අවසන්වනතුරු බලාගෙන සිටීම හරි. නමුත් ඒ කාර්යය අපි කරන්න ඕන නැහැනේ. කවුරු හෝ නිලධාරියෙක් ඒ වැඩේ ඉවර වෙනකල් කරන්න ඕන. අන්තිමට මට තමයි ඒ වාහනයේ නැගලා යන්න සිද්ධ වුණේ. යෝජනාවක් ගේනකොට එක් පුද්ගලයෙකුට අසාධාරණයකුත් බොහෝ පිරිසකට සාධාරණයකුත් සිද්ධ වෙන අවස්ථා තියෙනවා. මගේ යෝජනාවේදී මට ගවයින් ඇති කරන පුද්ගලයාත්,පීඩාවට ලක්වන මිනිස්සුත් මට අවශ්‍යයි.ඒ විදිහේ වැඩ ඉදිරියට සිදු නොවන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

රටේ කන්න නැතිව,ඩීසල් /පෙට්‍රල් නැතිව ජනතාව දුක් විඳින බව අපි දන්නවා.බදුල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවේ අද ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනාම ඌවපරණගම ආසනයට ඇවිත් රැස්වීම් තියලා කැන්වසින් ගිය අය නෙවෙයි. අපි තමයි තැන තැන රැස්වීම් පවත්වලා කැන්වසින් ගිහිල්ලා මේ අයට ඡන්දය දෙන්න කියලා ඉල්ලීම් කලේ. ඒ නිසා එතුමන්ලාට වැඩිය අපි වගකීම ගන්න ඕන.මිනිස්සු අපට බනින එක සාධාරණයි.ඒවගේම අපි පත්කර ගන්නා මන්ත්‍රීවරුන්ටත් කියන්න ඕන පාර්ලිමේන්තුව ඇතුලේ ඌවපරණගම,වැලිමඩ ප්‍රදේශ ගැන මොනාද කතා කරන්න ඕන කියලා. අද රට පත්වෙලා තියෙන තත්ත්වය ගැන කණගාටු වෙනවා. හිටපු ජනාධිපතිතුමාත්,කලින් හිටපු අයත් මේකට වගකියන්න ඕන. අපි කැපවෙලා හැටනව ලක්ෂයක් ඡන්දය දීලා ජනාධිපතිකමට පත් කලාට පස්සේ මේ වගේ අවස්ථාවකදී රට හැරලා ගිය එකට විරුද්ධයි. එතුමාට තිබුණා ජනාධිපතිකමෙන් ඉවත්වෙලා වරදක් නොකලා නම් ලංකාවේ ඉඳලා ප්‍රකාශයක් කරන්න. අන්තිමට රට අගාධයට දාලා එතුමා ගියා.මෙවැනි නායකයින් නැවත බිහි නොවේවා කියලා පතනවා. ඒවගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වීමට සුදුසුකමක් ලෙස ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කලා නම් හොඳ යැයි සිතනවා. ප්‍රාදේශීය සභාවක හිටියා නම් දන්නවා කොහොමද පාර්ලිමේන්තුවේ කතා කරන්න ඕන කියලා.පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විය යුත්තේ උගතෙක්.අපේ සභාපතිතුමාට ඒ ගමන යන්න දීලා තිබුණා නම් අද ඌවපරණගම නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වෙන්නේ මෙතුමායි කියමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ,ඊ.සෝමා එදිරිසිංහ මැතිතුමිය :-**

ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ තුන්වාරයක් සභාපතිධූරය දරලා අපට නායකත්වය දීපු අපේ හිටපු ගරු සභාපතිනි,පුණ්‍යා බුද්ධදාස මැතිනිය අද අසනීප තත්ත්වයෙන් ඉන්නවා. මම එතුමියට ඉක්මන් සුවය ලැබේවා කියලා මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ,ඩී.එම්.කරුණාදාස මැතිතුමා :-**

සියලු දෙනාගෙන්ම අවසරයි.මේ රට දැන් පත්වෙලා තියෙන තත්ත්වය අවුරුදු හැත්තෑවකට පමණ පෙර සිට ඇති වු තත්ත්වයක්. උඩුහාවර කොට්ඨාශයේ විථි ලාම්පුවක් සවි කිරිම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාටත්,ප්‍රාදේශීය සභාවටත් මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම ඉන්දියාවෙන් ඇනවුම් කල යූරියා මෙට්‍රික් ටොන් 45000ක් ලැබිලා

තියෙනවා. මුල්ම තොගය දෙන්නේ වී ගොවිතැන සඳහා කියලා ඌවපරණගම ආසනයේ වී වගා කරන කුඹුරු කොපමණ ප්‍රමාණයක් තියෙනවාද කියලා තොරතුරු අරන් තියෙනවා.අපි හේතු දක්වලා තියෙනවා වතුර නැහැ දේශගුණික විපර්යාස මත වී වගා කරන්න බැහැ කියලා. ඌවපරණගම ප්‍රාදේශීය සභාව මඟින් ඔබතුමා ලිපියක් යොමු කරන්න ගොවිජන සේවා කොමසාරිස්තුමාට ඉහල ඌව වැලිමඩ/ඌවපරණගම ජනතාව හේන්වල එළවළු වගා කරන අය ඉන්නේ. ඒ නිසා ඔවුන්ට පොහොර ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා. ආය ආරංචියක් තියෙනවා මේ යූරියා පොහොර මිටිය ලබා දෙන්නෙත් අඩු ආදායම්ලාභීන්ට බව. මේ වෙනකොට ගම්වලට දෙන සියලුම ආධාර ලබා දෙන්නේ අඩු ආදායම්ලාභීන්ට. ඒක හරි අසාධාරණයි. 2015 සමෘද්ධි සහනාධාර ලබා දෙන්න කරපු සමීක්ෂණය මේ වෙනකොට සංඛ්‍යා දත්ත වෙනස් වෙලා තියෙනවා. එදා දුප්පත්ව හිටපු අය අද දියුණුවෙලා තියෙන්නත් පුළුවන්. දියුණු තත්ත්වයේ හිටපු අය පහල මට්ටමට ඇවිත් තියෙන්නත් පුළුවන්.මේ වෙලාවේ රාජ්‍ය සේවකයාගේ සිට සියලුම දෙනාට දෙන දීමනා ලැබීමට සැලැස්විය යුතුයි.ඔබතුමා සම්බන්ධීකරණ කමිටුව තියෙන දිනය අපට දන්වන්න. මම එදාට සම්බන්ධ වෙන්නම්.

**ගරු සභාපතිතුමා :-**

සියලු දෙනාගෙන්ම අවසරයි. අද දවසේ න්‍යාය පත්‍රයේ කටයුතු පවත්වාගෙන යන්න මට සහයෝගය දක්වපු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයේ සියලුම දෙනාටත්,සභා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පුද කරනවා. අපි උළුගල ප්‍රශ්නය සම්බන්ධයෙන් අපේ පැත්තෙන් ගන්න ඕන පියවර අරන් තියෙනවා. මධ්‍යම පරිසර අධිකාරියටත් දැනුම් දුන්නා. මේ සම්බන්ධව පහුගිය සභාවේදීත් සභාගතකලා ඒ තීරණ සම්බන්ධයෙන්.ගරු මන්ත්‍රීතුමාටත් පිටපතක් දෙන්න කියලා මම සභා ලේකම්තුමියට කීවා. නැවත වතාවක් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න බලාපොරොත්තු වෙනවා. කර්මාන්තය නතර කරන්න අපට කිසිම බලයක් නැහැ. මධ්‍යම පරිසර අධිකාරියෙන් කර්මාන්තය ආරම්භ කරන්න අවසර පත්‍රයක් දීලා තියෙන්නේ.මහජන පීඩාවක් වෙනවා කියන එක දැනුවත් කරන්නම්.

රටේ තියෙන තත්ත්වය ගැන ඔබතුමන්ලා අදහස් දැක්වුවා.අපට බලන් ඉන්න විතරයි පුළුවන්.ප්‍රාදේශීය සභාවේ කාර්ය භාරය තමයි මට පැවරිලා තියෙන්නේ. මන්ත්‍රීතුමා මතුකල ඉහල ඌවට පොහොර බෙදීම සම්බන්ධයෙන්. අපි පත්කරලා ඉන්නවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. මෙය පාර්ලිමේන්තුවේ මතුකල යුතු ප්‍රශ්නයක්. සම්බන්ධීකරණ කමිටුව තියෙන්න සභාපති කෙනෙකුත් නැහැ පවත්වන දිනයකුත් නැහැ.ඒ නිසා මේ රටේ පවතින ක්‍රමවේද සියල්ලක්ම බිඳ වැටිලා තියෙනවා. අපේ ආයතන ස්වාධීන ආයතනයක් ලෙස පවත්වාගෙන යන්නේ. නැත්නම් අපටත් පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ. ඒ තත්ත්වය යථා තත්ත්වයට පත්වුණාට පසු තමයි නිවැරදි ක්‍රමවේදයන් අනුව අපට කතා කරන්න පුළුවන් වෙන්නේ.මම දන්න විදිහට නම් අඩු ආදායම්ලාභීන්ට පොහොර දෙනවා කියලා කොහෙවත් ගැසට් එකක් නැහැ.සමාජ මාධ්‍ය ජාලා 50% ප්‍රගමනයට දායකත්වය දක්වනවා වගේම 50% අපගමනයට තමයි දායකත්වය දක්වන්නේ. ඒ නිසා බොරු මතවාද ප්‍රචාර කිරිම සඳහා තමයි ඒවා පාවිච්චි කරන්නේ.ඒ නිසා තමුන්නාන්සේලා සත්‍ය තොරතුරු පදනම් කරගනිමින් තීන්දු තීරණ ගන්න.

අපි දේශපාලන පක්ෂයක පහලම නියෝජිතයෝ.අපිට විරුද්ධව දේශපාලන පක්ෂයක පහලම නියෝජිතයාට දේශපාලනය කරන්න තියෙන අයිතිය වගේම අපිටත් තියෙන්නේ දේශපාලන අයිතියක්. මේ රට ඊලාම් රාජ්‍යයක් කරන්න ඕන කියන මතධාරින් උතුරේ විතරක් නෙවෙයි දකුණෙත් හිටියා.මත ප්‍රකාශ කිරිමේ අයිතියම පාවිච්චි කරලා ද්වේශයට හරවා ගන්නවා නම් මම ඒක විශ්වාස කරන්නේ නැහැ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ඉතාමත්ම වැදගත් කියලා. උදාහරණ ලෙස ලෝක ඉතිහාසයේ අපේ ශිෂ්ටාචාරය දෙස බලනකොට ප්‍රාථමික සමාජය තුළ බාහු ශක්තිය තියෙන කෙනා තමයි රටේ නායකයා වුණේ. අනෙක් මිනිහට ගහලා මරලා බලය ගන්න පුළුවන් නම් එයා තමයි ගෝත්‍රික නායකයා.සමාජය දියුණු තත්ත්වයට ආවාට පසු මිනිස්සු ගොඩක් වෙලාවට එය වෙනස් කරලා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ හරහා තමයි තමන්ගේ නායකයා තෝරලා ප්‍රජාතන්ත්‍රවාදි රාමුවට ඇවිත් තියෙන්නේ. ආණ්ඩුව කියන එක බිහිවෙන්නේ මිනිසුන්ගේ කැමැත්ත අනුව. අද දවස දිහා බැලුවාම ඒ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ජීව ගුණය අප රට තුළ තියෙනවාද නැද්ද කියන එක අපේ රටේ දේශපාලනය වැරදි බව පිළිගන්න ඕන. ප්‍රතිපත්ති තීරණ අනුව. නමුත් එහෙම කියලා ප්‍රජාතන්ත්‍රවාදි රාමුවෙන් එහාට ගියාම අපේ කාලේ ඉවරයි. ඔබේ දරුවන්ට මේ රටේ අනාගත පරම්පරාවට මොන වගේ රටක්ද අපි නිර්මාණය කරන්නේ. ප්‍රාදේශීය දේශපාලඥයෝ විදිහට මොන දේශපාලන පක්ෂයේ හිටියත් මම දන්නවා මේ තියෙන තත්ත්වය යටතේ ඔබ යම් පීඩනයකට ලක්වෙලා ඉන්නවා. ඒ අපි සමාජ සේවය කරන්න ගිහිල්ලා.ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා මොන පක්ෂයේ හිටියත් සමාජ තත්ත්වයත් එක්ක සාමාන්‍ය මිනිසාට වඩා යම් පීඩනයකට ලක් වෙනවා. අපි විතරයි දන්නේ අපි කරන ක්‍රියාදාමය.අපේ වපසරිය මොකක්ද කියලා. සමහර දේවල් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයාට/සභාපතිවරයාට ගන්න තීන්දු තීරණ ආපස්සට හරවන්න බැහැ.අපිට ගිහින් දේශපාලන බල මණ්ඩලයේ ඉදගන්න පුළුවන්කමක් නැහැ.රටේ තියෙන දේශපාලන තත්ත්වයන්ට අනුගත වෙලා සමහර වෙලාවට දේශපාලනය කරන්න පුළුවන්.මම විශ්වාස කරනවා මේ සිදුවීම් එක්ක ප්‍රචණ්ඩත්වයෙන් තොර මානවවාදි විදිහට දේශපාලනය සහ සමාජ සේවය කරන මිනිස්සු අපේ රටේ බොහොම අඩුවෙයි කියලා. මම ඔබෙන් ඉල්ලීමක් කරනවා මොන දේශපාලන පක්ෂයේ හිටියත් අල්ලපු ගෙදර අය විරුද්ධ දේශපාලන මතධාරීන් වුවත් වෛරය පතුරුවන්න එපා කියලා. රටේ මොනවගේ තත්ත්වයක් ඇති වෙයිද කියලා අපට කියන්න බැහැ.ජනාධිපතිතුමාට/අගමැතිතුමාට මේ වගේ දේවල් සිද්ධ වෙනවා නම් ඔබට මට මොන කතාද?නීතිය කියන එක අප සැමට ඉහලින් තියෙන්න ඕන. ඒත් අද එහෙම නැහැ.මේ සියල්ලකම් හරහා රට අරාජිකත්වයට යනවා.අපි ප්‍රර්ථනා කරමු රට හොඳ තත්ත්වයට පත්වේවා කියා.

මේ සභාව තුළ අපට දෙන්න පුළුවන් දායකත්වය ලබාදීලා ඉතාමත් හොඳින් කරගෙන ආවා.ඒ සඳහා මට තමුන්නාන්සේලා සියලු දෙනාගේ සහයෝගය ලැබුණා.සමහර වෙලාවට අපට ඊලඟ සභාව පවත්වන්න බැරි වෙන්න පුළුවන්.අපට අතිරේක කාලයක් ලබා දී තියෙන නිසා විසුරුවා හරින්න පුළුවන්.මම පළාත් විගණකාධිපතිතුමාත් එක්කත් කතා කලා.එතුමාත් කීවේ එහෙම වෙන්න බෑ සභාපතිතුමා ජනතා නියෝජිතයින් රටකට ඉන්න ඕන.අපි විසුරුවා ගියත් අපේ පනතේ 9(3) වගන්තිය යටතේ සභා ලේකම්ට බලය පැවරෙනවා. නමුත් ඔබ හිතන්න එපා අද අපි කතා කරන ප්‍රශ්න 9(3) යටතේ සිද්ධ වෙයි කියලා. කළමනාකරණ කමිටුවේ බලය පැවරෙන්නේ සභා ලේකම්තුමියට. එතුමිය කාර්යයන් ඉටු කරන්නේ කාර්ය මණ්ඩලයත් සමඟ. ඔවුන් මේ ගැන කතා කරයි කියලා බලාපොරොත්තු වෙන්න එපා.මොකද ඔවුන් පැය 8 රාජකාරියක් ඉටු කරන්නේ. මේ තරම් ජනතා නියෝජනයක් ඒ කමිටුව තුළින් කරයි කියලා බලාපොරොත්තු වෙන්න බෑ.ඔබටයි මටයි බැඳුණු සමාජ සේවයක් ඔවුන් ළඟ නැහැ. පොදු මහජන සේවාවන් පවත්වාගෙන යන්න අමාරුයි.ආයතනය පවත්වාගෙන යන්න පුළුවන්.

ඔබලා මට දුන්න සහයෝගය මම ඉතාමත් නිහතමානීව අගය කරනවා. මේ ප්‍රාදේශීය සභාවේ ගෞරවය,ඔබතුමන්ලාගේ/තුමියන්ලාගේ ගෞරවය කිසිම ක්‍රියාදාමයකින් අබමල් රේණුවකින්වත් කෙලසන්නේ නැතිව මේ කාල සීමාව තුළ පවත්වාගෙන ආවා කියන එක විශ්වාස කරනවා.ඔබ හැම සභා යෝජනාවකදීම සහ ගන්න තීන්දු තීරණ වලදී අපි සාමූහිකව තීන්දු තීරණ ගත්තා. දේශපාලනයේ හැසිරීම අනුව අපි තීරණය කරමු ඉදිරියට දේශපානය කරවාද?නැද්ද කියලා. මගේ අදහස් ප්‍රකාශ කිරිම මෙතනින් අවසන් කරනවා.සියලු දෙනාටම තෙරුවන් සරණයි.!

ඒ අනුව පෙ.ව.11.00 ට ගරු සභාපතිතුමා විසින් සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ස්තුතියි.
මෙයට
විශ්වාසී,

සමින්ද සුදර්ශන කුරුප්පුආරච්චි,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව ,

මෙම සභා වාර්තාව ...................... වන දින පැවති මහ සභාවේදී ..................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ යෝජනාවෙන් .................................................................... ගරු මන්ත්‍රීතුමාගේ/තුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/සංශෝධනයට යටත්ව සභා සම්මත විය.

උදය ප්‍රදීප් මහතා සභාවට කැඳවන ලදි.

කාර්මික නිලධාරින් සභාවට කැඳවන ලදි.